# ව්‍යවස්ථාව සැකසීමට ජනතාවගේ අදහස් විමසීමෙන් ප්‍රයෝජන ගන්න

## පැෆරල් සංවිධානය කියයි

මනම්පිටිය - නිමල් ජයරත්න

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීම සඳහා ඉතිහාසයේ පළමු වරට මහජනතාවගෙන් අදහස් විමසීමක් ක්‍රියාත්මක වන අතර උදා වී ඇති එම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලෙස නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වයේ (පැෆරල් සංවිධානය) ජාතික සම්බන්ධීකාරක සුජීව ගයනාත් මහතා පවසයි.

අග්‍රාමාත්‍යවරයා විසින් පත්කර ඇති අමාත්‍ය අනුකමිටුව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය පිළිබඳව මහජන අදහස් විමසීම් දිස්ත්‍රික් මට්ටමින් මේ දිනවල රජය මගින් සිදුකරගෙන යන වැඩපිළිවෙල ඉතා වැදගත් බව ගයනාත් මහතා පැවැසුවේ පොළොන්නරුවේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදීය.

1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් සැකසීමේදී මහජනතාවගේ අදහස් විමසීම් හා යෝජනා ලබා නොගත් බවත් රට පාලනය කිරීමේ මූලික ලියවිල්ල සඳහා මහජන අදහස් විමසීම ප්‍රජාතන්ත්‍රවාදී රටක මූලික ලක්ෂණයක් බවත් ගයනාත් මහතා කීය.

දකුණු අප්‍රිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීමේදී එම රටේ මහජනතාවගෙන් මහජන අදහස් ලබා ගැනීම වසර 02ක් සිදුකර ඇති බවත් ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීමට මේ වසරේ මාර්තු මාසය දක්වා ඕනෑම භාෂාවකින් ලිඛිතව හෝ වාචිකව අදහස් ප්‍රකාශ කිරීමට ලබා දී ඇති කාලය ප්‍රමාණවත් නොවන බවත් ගයනාත් මහතා වැඩි දුරටත් පෙන්වා දුන්නේය.

මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවෙන් පොළොන්නරුව ජනතාවගේ අදහස් විමසීමට මේ මස 19 හා 20 යන දිනවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය පිළිබඳව මහජන අදහස් විමසීම් කමිටුවේ සභාපති නීතිඥ ලාල් විජේනායක මහතා ඇතුළු 20 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණීමට නියමිත බවද හෙතෙම කීය.

එහිදී නව මැතිවරණ ක්‍රමයක් සඳහා වූ පොළොන්නරුව දිස්ත්‍රික් පුරවැසි ක්‍රියාකාරීත්වය විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන බවත් මෙම අවස්ථාවට ඕනෑම පුද්ගලයෙකුට හෝ සංවිධානයකට ඉදිරිපත් වී යෝජනා ලබා දිය හැකි බවත් ගයනාත් මහතා පැවැසීය.

"ඇමරිකාවේ අවුරුදු 225ක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 27 වතාවක් සංශෝධනය වුණා. 1978 අපේ රටේ ව්‍යවස්ථාව අවුරුදු 37ත් තුළ මේ වනවිට 19 වතාවක් සංශෝධනය වෙලා තියෙනවා. මේක රට පාලනය කරන මූලික ලියවිල්ල නිසා කෙටි කාලයක් තුළ මහජන අදහස් විමසලා හදන එක සුදුසු නැහැ. මේකට වැඩිපුර කාලයක් යොදා ගන්න කියලා අපි පැෆරල් සංවිධානය වශයෙන් යෝජනා කරලා තියෙනවා.

රටක් පාලනය කළ යුතු මූලික ලියවිල්ල හොඳටම කාලය අරන් කළ යුතු කාර්යයක්. ඒ නිසා ඉතිහාසයේ පළමුවරට මහජනතාවගෙන් විමසීම් කරලා යෝජනා අරන් හදන මේ මූලික ලියවිල්ල වඩාත් කල් අරන් කරන එක ඉතාම වැදගත් යැයි සුජීව ගයනාත් මහතා වැඩිදුරටත් පැවැසීය.